**ශීර්ෂය 101 - බුද්ධශාසන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 101 - බුද්ධශාසන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

------------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 901.62 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 871.72 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 29.90 ක් හෙවත් සියයට 3.32 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 175.02 | 162.73 | 12.29 | 7.02 |
| මූලධන | 726.60 | 708.99 | 17.61 | 2.42 |
| එකතුව | 901.62 | 871.72 | 29.90 | 3.32 |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 10101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.00 | 6.56 | 2.40 | 3.49 | 22.00 | 14.52 |

**2.3** **අග්‍රිම ගිණුම**

2016 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0209/0016/000 දරන අමාත්‍යාංශය යටතේ වූ අග්‍රිම ගිණුමේ ශේෂය රු.30,000 ක් විය.

**2.4** **පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 4 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 68.86 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0058/000 | 0.19 |
| 6000/0000/00/0018/0015/000 | 25.81 |
| 6000/0000/00/0016/0013/000 | 42.74 |
| 6000/0000/00/0013/0149/000 | 0.12 |
| එකතුව | 68.86 |

**2.5** **විගණන නිරීක්ෂණය**

බුද්ධශාසන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන

නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් දෙකකට 2017 සැප්තැම්බර් 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.මිලියන 123.35 ක් වී තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.8,875,856 ක් වූ තැන්පතු 7 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**වත්කම් තක්සේරු කර නොතිබීම**

අමාත්‍යාංශය භාරයේ පවතින කුරුන්දම්කුලම රජරට චාරිකා නිවාසය හා ඉඩම තක්සේරු කර ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 බැරකම්වලට එළඹීම**

මුදල් රෙගුලාසි 94 (1) ට පටහැනිව වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 2.31 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.6 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ------------------------------ | ------------ | ------------------- |
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------------ | | |
| | මුදල් රෙගුලාසි 104 | 212,683 | මුදල් රෙගුලාසි 104 (1) අනුව පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත් මෝටර් රථ අනතුරු දෙකකට අදාළව එසේ කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ<br>------------------------- | | |
| | 2015 ජුනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 (1) වගන්තිය | 5,000,000 | 2015 වර්ෂයේ රාජ්‍ය වෙසක් උත්සවය වෙනුවෙන් උත්සවය පැවැත්වීමෙන් පසුව අනුග්‍රාහකයන් ලබාදුන් මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවත් එසේ නොකර බුද්ධශාසන අරමුදලට ලබාදී තිබුණි. |

**3.7 කාර්යසාධනය**

-----------------

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

-----------------------------------------------

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාළ කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවල දී එසේ අනාවරණය වූ අවස්ථාවක් පහත දැක්වේ.

**ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන - 2016**

---

මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වෙන් කරන ලද රු.මිලියන 5 ක ප්‍රතිපාදනවලින් සියයට 54 ක් වූ රු.2,698,750 ක මුදල් දකුණු පළාතේ දහම් පාසල් සිසුන් සඳහා ගද්‍ය පද්‍ය හා කෙටිනාට්‍ය තරඟාවලියක් පැවැත්වීම සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

---

**රාජ්‍ය වෙසක් උත්සවය - 2016**

---

2016 රාජ්‍ය වෙසක් උත්සවය හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරකැටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් නයිගල රජමහා විහාරයේ පවත්වා තිබුණි. අමාත්‍යාංශය විසින් විහාරස්ථාන සංවර්ධනය හා උත්සවය පැවැත්වීම සඳහා රු.47,559,140 ක් වියදම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ)** බුද්ධශාසන අමාත්‍යාංශය විසින් රාජ්‍ය වෙසක් උත්සවය පැවැත්වීම සඳහා ස්ථානය තීරණය කිරීම හා ඒ හා බැදි සංවර්ධන වැඩ නිශ්චිතව තීරණය කර සැලැසුම් සකස් කර නොතිබුණි.

**(ආ)** නයිගල රජමහා විහාරයේ අලුත්වැඩියාවන් සඳහා රු.14,608,026 ක් වැයකර තිබුණි. එම වියදම් සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු සහිතව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 මාර්ගෝපදේශය පරිදි සියලු ආශ්‍රිත වියදම් ඇතුළත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

**(ඇ)** වෙසක් උත්සවයට සමගාමීව නයිගල සහ කසාගල විහාරස්ථානවල සිදුකරනලද ඉදිකිරීම් සහ අලුත්වැඩියා කටයුතුවලට අදාළ කළ වැඩ වාර්තා නොතිබු අතර වියදම් තක්සේරු කර නොතිබුණි.

**3.8 අවිධිමත් ගනුදෙනු**

---

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවෙන් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) නාගදීප රජමහා විහාරයේ ඉදිකිරීම් සඳහා මූල්‍ය ආධාර සැපයීම**

---

බුද්ධශාසන අමාත්‍යාංශය විසින් නාගදීප රජමහා විහාරයේ ධර්මශාලාවේ තෙවන මහල ඉදිකිරීම සඳහා රු.6,657,605 ක් ලබා දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** අමාත්‍යාංශය විසින්, ඉදිකිරීම් සිදු කරන ලද නාවික හමුදාව වෙතින් ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තුවක් සහ වියදම් වාර්තා ලබාගෙන නොතිබුණි.

**(ii)** 2016 අගොස්තු 31 දින වන විට ඉදිකිරීම් කටයුතු නිමකළ යුතුව තිබුණි. නමුත් 2016 අගෝස්තු 22 වන දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී, සමස්ත නිම කිරීම් වල භෞතික ප්‍රගතිය සියයට 58 ක් බව නිරීක්ෂණය විය. අදාළ කාර්යයන්, සැහිමට පත්විය හැකි පරිදි

ඉටුකර ඇති බවට අමාත්‍යාංශ ලේකම් විසින් පිළිතුරු සපයා ඇතත් ඊට අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) අස්ගිරි මහා විහාරයේ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන මුදාහැරීම**

---------------------------------------------------------------------------

අස්ගිරි මහා විහාරයේ සංවර්ධන කටයුතු සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නාවික හමුදාපති වෙත රු.මිලියන 87.88 ක් ද, විදුලිබල මණ්ඩලය, මහනුවර දිස්ත්‍රික් ලේකම්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සඳහා රු.මිලියන 33.91 ක් ද වශයෙන් රු.මිලියන 121.79 ක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** අස්ගිරි මහා විහාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 91 ක ඇස්තමේන්තුවක් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණි. එම ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ නුවර කටුගස්තොට මාර්ගයේ සිට වාහල්කඩ දක්වා වූ මාර්ගය කාපට් කිරීම සඳහා රු.මිලියන 20 ක් නාවික හමුදාපති වෙත ගෙවා තිබුණි. ඉහත ඇස්තමේන්තුවට ඇතුළත් නොවූ මාර්ග සංවර්ධන කටයුතු විදුලි සැපයීම වැනි කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් අමතර ප්‍රතිපාදන ලබාගැනීමට ද පූජාභූමි සංවර්ධනය වැය ශීර්ෂය යටතේ වෙන්කරන ලද මුදල් මේ සඳහා උපයෝජනය කිරීමට ද, සිදුව තිබුණි.

**(ii)** ගොඩනැගිල්ලට දකුණු පස තිබූ කන්ද ඉවත් කර තිබූ අතර එම පස් කුමක් සඳහා යොදවා ගත්තේ ද යන්න පැහැදිලි කර නොතිබුණි.

**(iii)** ඇස්තමේන්තුව අනුව වැහිපීලි යොදා නොතිබුණි.

**(iv)** වහලයෙන් පතිතවන වැහි වතුර හා මල අපද්‍රව්‍ය බැහැර කිරීමට සැලසුම් සකස් කර නොතිබුණි.

**(v)** අස්ගිරිය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උපාලි මහථෙර අනුස්මරණ විශ්‍රාම ශාලාව ඉදිකිරීම සඳහා සැලැසුම් සකස් කර නොතිබුණ ද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව අවස්ථා 4 ක දි රු. මිලියන 15 ක් වැයකර තිබුණි. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේම එම ගෙවීම් සඳහා ලදුපතක් ලබාගෙන නොතිබුණි.

**(vi)** උපාලි මහථෙර අනුස්මරණ විශ්‍රාම ශාලාව පෞද්ගලික අරමුදල්වලින් පෞද්ගලික කොන්ත්‍රාකරුවන් යොදවා ආරම්භ කරන ලද ඉදිකිරීමකි. එහි කටයුතු නිම කිරීම සඳහා රජයේ අරමුදල් යෙදවා තිබුණ ද, යෙදවූ අරමුදල්වල කාර්යසාධනය පිළිබඳ වාර්තා ලබාගෙන නොතිබුණි.

**(vii)** දිග අඩි 320 ක් හා උස අඩි 22 ක ප්‍රමාණයේ කොන්ක්‍රීට් රැදවුම් බැම්මක් ඉදිකිරීම සඳහා රු.මිලියන 17.15 ක ඇස්තමේන්තු කර තිබුණි. පිවිසුම් මාර්ගයේ පිහිටීම නිල ආරාමයට වඩා පොළොව මට්ටමින් උස්ව පිහිටීම නිසා නිල ආරාමය දෙසට ජලය ගලා ඒම නිරීක්ෂණය විය. එය වැළැක්වීම සඳහා පහළින් ඇති අස්ගිරි විහාර ප්‍රවේශ මාර්ගයට සම්බන්ධ වන සේ පස් තට්ටුවක් ඉවත් කිරීමට යෝජනා කර තිබීම හේතුවෙන් රැදවුම් බැම්ම ඉදි කිරීමේ කටයුතු අතරමග නවතා තිබුණි.

(viii) ඉංග්‍රීසි දහම් පාසලක් හා භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.මිලියන 2.00 ක් මහනුවර දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබුණි. අමාත්‍යාංශය විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ ප්‍රගති වාර්තා ලබාගෙන නොතිබුණි.

(ix) අස්ගිරි විහාරයේ සංවර්ධන කටයුතු සඳහා සැලසුම් සකස් කිරීම හා තාක්ෂණික උපදෙස් සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු සම්බන්ධව එකගතාවයකට එළඹ නොතිබිය දී, අවස්ථා 2 ක දි ඇස්තමේන්තුවෙන් සියයට 5 ක් ලෙස රු.මිලියන 1.20 ක් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. මෙම ගෙවීම්වලට අදාළ කර ගත් 2012 පෙබරවාරි 15 දින අත්සන් කරණ ලද සේවා ගිවිසුම ව්‍යාජ එකක් බව වැඩිදුරටත් විගණනයට තහවුරු වී තිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 09 | 05 | - |
| (ii) | තෘතියක මට්ටම | 02 | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 141 | 80 | 61 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 28 | 08 | - |
| (v) | කොන්ත්‍රාත් පදනම | - | 04 | - | 04 |
| | එකතුව | 193 | 122 | 75 | 04 |